## වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
## තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය

**අවවාදයයි**

# ඔබගේ ඉඩමේ ඔප්පුව ව්‍යාජ ඔප්පුවක් නොවන වග………………. *විශ්වාසද?*

### 2005 අංක 20 දරණ පනතින් සංශෝධිත 1958 අංක 2 දරණ තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) පනත පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමයි.

2005 අංක 20 දරණ පනතින් සංශෝධිත 1958 අංක 2 දරණ තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) පනත අනුව තේ, රබර් සහ පොල් වතු කැබලි කිරීම සම්බන්ධයෙන් පහත විස්තර මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දන්වා සිටිමි.

**<u>ඉඩම් කැබලි කිරීම සම්බන්ධ විධි විධාන</u>**

**" හෙක්.04 (අක්කර 09 රූඩ් 03 ප. 21.44) ට වැඩි පොල් ඉඩම්වල අයිතිය සම්පූර්ණයෙන් හෝ කොටසක් පැවරීම සඳහා, තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය."**

**"හෙක්.20 (අක්කර 49 රූඩ් 01 ප 27.2) ට වැඩි රබර් සහ තේ ඉඩම් වල අයිතිය සම්පූර්ණයෙන් හෝ කොටසක් පැවරීම සඳහා තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය."**

- මණ්ඩලයේ පූර්ව අනුමැතිය නොමැතිව පවරන ලද ඔප්පු ලියාපදිංචි කිරීම නීති විරෝධී වන අතර, අනුමැතිය නොමැතිව ලියාපදිංචි කරන ඔප්පු බල රහිතය.
- මෙම මණ්ඩලයේ අනුමැතිය රහිතව, පළාත් පාලන ආයතන විසින් සැලසුම් අනුමත කිරීම නීත්‍යානුකූල නොවන අතර, පනත අනුව, දඬුවම් ලැබිය හැකි වරදකි. (රුපියල් ලක්ෂයකට නොවැඩි මුදලක්, වසරකට නොවැඩි සිර දඬුවමක් හෝ එම දඬුවම් දෙකම)
- ඔප්පු ලිවීමට ප්‍රථම මේ පිළිබඳව නොතාරිස්වරුන් සැලකිලිමත් විය යුතුවේ

**එබැවින්, පොල් ඉඩම් මිල දී ගැනීමේ දී මහජනතාව විසින්,**

- *එකී ඉඩම හෙක්. 04 ට වැඩි පොල් ඉඩමක් නම් එය කැබලි කිරීමට තේ, රබර්, පොල් ඉඩම් (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ නිසි අවසරය ලබා ඇත්දැයි සොයා බැලිය යුතුය.*

**තේ සහ රබර් ඉඩම් මිල දී ගැනීමේ දී මහජනතාව විසින්,**

- *එකී ඉඩම හෙක්. 20 ට වැඩි තේ හෝ රබර් ඉඩමක් නම් එය කැබලි කිරීමට තේ, රබර්, පොල් ඉඩම් (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ නිසි අවසරය ලබා ඇත්දැයි සොයා බැලිය යුතුය.*

**<u>පනතෙහි විධි විධාන උල්ලංඝනය කළහොත් පැනවෙන දඬුවම්</u>**

*තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ අනුමැතියකින් තොරව පළාත් පාලන ආයතන විසින් සැලසුම් අනුමත කරනු ලැබූ අවස්ථාවල දී, එසේ අනුමත කළ නිලධාරීන්ට එරෙහිව පනතේ අංක 23 අ (2) වගන්තිය අනුව මහේස්ත්‍රාත් අධිකරණයක දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව, එක් වසරකට නොවැඩි සිර දඬුවමකට හෝ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ එම දඬුවම් දෙකටම හෝ යටත් කළ හැකිය.*

ඔබගේ ඉඩම් කැබලි කිරීමේ දී සිදුවන අපහසුතාවයන් වළක්වා ගැනීම සඳහා ඉහත සඳහන් කොන්දේසි අනුව, නියමිත අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ. කැබලි කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන අයදුම් පත්‍ර ඔබ පදිංචි ප්‍රදේශයට ආසන්නතම පහත සඳහන් ප්‍රාදේශීය කාර්යාලවලින්ද ලබා ගත හැකිය.

1. පොල් වගා කිරීමේ මණ්ඩලය යටතේ ඇති සියළුම ප්‍රාදේශීය කාර්යාල
2. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඇති සියළුම ප්‍රාදේශීය කාර්යාල
3. තේ මණ්ඩලය යටතේ ඇති තේ කොමසාරිස් අංශයේ ප්‍රාදේශීය කාර්යාල

සභාපති
තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය